

# 1 පරිගණක සහ පර්යන්ත උපාංග මිල දී ගැනීම සඳහා පිරිවිතර සැකසීම

**ක්‍රියාකාරකම 1.1**

දී ඇති පද අතරින් සුදුසු ම පද භාවිත කර හිස්තැන් පුරවන්න.

පද ලැයිස්තුව

(1) සේවාදායක පරිගණකය
(2) මේස පරිගණකය
(3) සියල්ල ම එකක පරිගණකය
(4) උකුළු පරිගණකය
(5) සුහුරු ජංගම දුරකථනය
(6) ටැබ්ලට් පරිගණකය

a). නිවසේ දී හෝ කාර්යාලයේ දී හෝ නිශ්චිත ස්ථානයක සිට භාවිත කිරීමට ........................................ යොදා ගැනේ.

b). පරිගණක ජාලයකට අවශ්‍ය සේවා ලබාදීමට ........................................ භාවිත කෙරේ.

c). ජංගමව භාවිත කළ හැකි, සාපේක්ෂව විශාල පරිගණක තිරයක් සහිත පරිගණකය ........................................ වේ.

d). සිසුන්ට ලේඛන කියවීමට, තැන්පත් කිරීමට සහ විද්‍යුත් ශබ්ද කෝෂ පරිහරණය පහසුවෙන් කිරීමට අන්තර්ජාලය හරහා සන්නිවේදන කටයුතුවලට ජංගමව භාවිත කළ හැකි පරිගණක වන්නේ (i) ........................................ සහ (ii) ........................................ වේ.

e). එහා මෙහා ගෙන යාමට අසීරු, අඩු ඉඩකඩ භාවිත කළ හැකි, පර්යන්ත උපාංග රැසක් සංදර්ශකයට සවිකර ඇත්තේ ........................................ ක වේ.



LIVEWORKSHEETS